

# සංගීතයට ආගම් ජාති කුල බේධයක් නෑ.. එය විශ්ව භාෂාවක්.. කැමරන් කොළඹගේ



ඔස්ට්‍රේලියාවේ සිංහල සංගීතය ගැන කතා කරන විට ඔහු ගැන කතා නොක-රම බැහැ. ඔහුගේ ගිටාරයෙන් ඕගනයෙන් රසවත් කෙරුණ ශ්‍රී ලාංකික ප්‍රසංග ඔබ නොදැක සිටින්නට කොහෙත්තම ඉඩක් නැහැ. ඔහුගේ තනු නිර්මාණ හරහා බිහිවුණ ගී රැසක් අද ඉතා ජනප්‍රියයි. ඔහුගේ තරංගා සංගීත කණ්ඩායම හොඳ සංගීත ප්‍රසංගයක පදනම යි කිව්වොත්

## මුහුණට මුහුණ

ශ්‍රීනාත් මද්දුමගේ

නිවැරදියි.
සෑම සංගීත කටයුත්තකදීම සිය දායකත්වය නොමසුරුව පුද කරන මේ සංගීතඥයා අද මුහුණට මුහුණ සමග මෙසේ එක්වෙනවා.

**ශ්‍රීනාත්**
මුලින්ම සංගීතයට යොමුවුණේ කොහොමද?
**කැමරන්**
තාත්තාගෙන් කිව්වොත් නිවැරදියි. අපේ තාත්තා තමයි අල්රඩ් කොළඹගේ. ඔහු මොහොමඩ් සාලි මහත්මයාගේ සංගීත කණ්ඩායමේ වාදකයකු ලෙස සංගීතයට සම්බන්දව හිටියා. ඔහුගේ ආභාෂය මං හිතන්නෙ මට ලැබෙන්න ඇති. ඒ එක්කම පල්ලයත් අමතක කරන්න බැහැ. මම පල්ලියේ ගීතිකා කණ්ඩායමේ සාමාජිකයෙක් වෙලා හිටියා. එහිදී සංගීතය පිළිබඳ යම් යම් දේවල් ඉගෙනගන්න අවස්තාව ලැබුණා. නමුත් මම සංගීතය ඉගෙන ගත්තෙ තනියම මයි.

ඒ ගමන්ම සංගීත කණ්ඩායමක් පටන් ගත්ත ද?
**කැමරන්**
නෑ. ටික කාලයක් හිටියා. ඊට පස්සෙ තුසිත කුලසේකර රෝහිත උඩවෙල නාලක වීරකෝන් වැනි අය සමග සම්බන්ධ වෙලා මෙරටේ සංගීත කටයුතු වලට යොමු වුණා.

**ශ්‍රීනාත්**
තරංගා සංගීත කණ්ඩායම හැදුවෙ ඊට පස්සෙ ද?
**කැමරන්**
ඔව්.. එද ාමාත් එකක් හිටපු ඉහත නම් සඳහන් කළ ශිල්පීන් අදත් මාත් සමග ඉන්නවා. ඒ ගැන විශේෂයෙන් මතක් කරන්න ඕනෙ.

තරංගා සංගීත කණ්ඩායම ගායන ශිල්පින්ට පසුබිම් සංගීතය සැපයීම පමණක් ද කරන්නෙ?
නෑ.. අපව වැඩිපුර පේන්නෙ පසුබිම් සංගීතය සපයන කණ්ඩායමක් හැටියට තමයි. නමුත් අපේ සංගීත කණ්ඩායම විවිධ සන්දර්ශණ වලට සහභාගි වෙනවා.

**ශ්‍රීනාත්**
සංගීත කණ්ඩායමක් ජනප්‍රියත්වය රඳවාගන්නට කැපවීමක් කළ යුතුයි නේද?
**කැමරන්**
ඇත්තෙන්ම ඔව් ශ්‍රීනාත්.. විශාල කැපවීමක් කරන්න ඕනෙ.. පුහුණු වීම් වෙන්න ඕනෙ.. කරන කාර්යය හරියාකාරව හොඳ පුහුණුවකින් කරන්න ඕනෙ.

**ශ්‍රීනාත්**
ඔබ පන්සලේ පල්ලියේ හැමතැනම එක සේ ඉන්නා බවක් පේනවා
**කැමරන්**
ඔව්.. සංගීතය කියන්නෙ විශ්ව භාෂාවක්.. එයට ආගම් ජාති කුල බේධ කිසිවක් අදාල වන්නේ නැහැ.. ඕනෑම කෙනෙකුට මේ සියල්ල අමතක කරලා සංගීතය රස විඳින්න පුලුවන්.ඩ එකට එකතු වන්න පුළුවන්.. ඒ තමයි සංගීතයේ තියෙන අපූර්වත්වය.





තරංගා



කැමරන් - තරුණ සංගීතඥයා

**ශ්‍රීනාත්**
ඔබේ පාසල් කාලය මතක කළොත්
**කැමරන්**
මම පාසල් ගියේ බම්බලපිටියේ ශාන්ත ජෝෂප් විද්‍යාලයටයි. නමුත් විද්‍යාලයේදී මම සංගීත කටයුතු වලට යොමු වුණේ නැහැ.

**ශ්‍රීනාත්**
මුලින්ම සංගීත කණ්ඩායමකට සම්බන්ධ වුණේ මොන අවුරුද්දෙ ද?
**කැමරන්**
ශ්‍රීනාත් මම මුලින්ම 1976 කැලිප්සෝ සංගීත කණ්ඩායමක ගිටාර් වාදකයෙකු හැටියට හිටියා. ඒ වකවානුව වන විට කැලිප්සෝ සංගීත කණ්ඩායම් ඉතාමත් ජනප්‍රිය වී තිබුණා. ඉන් පස්සෙ 1980 වන විට මම සන්ෂයින් සංගීත කණ්ඩායම සමග සම්බන්ධ වුණා. ඊට පස්සෙ පැට්‍රික් දෙනිපිටිය මහත්මයාගේ සංගීත කණ්ඩායමට සම්බන්ධ වෙලා ඔස්ට්‍රේලියාවටෙ පැමිණෙන තෙක් මම එහි බේස් ගිටාර් වාදකයා හැටියට කටයුතු කළා.

**ශ්‍රීනාත්**
ඔස්ට්‍රේලියාවට ආවෙ මොන අවුරුද්දෙ ද?
මම ඔස්ට්‍රේලියාවට ආවෙ 1986 දි.

**ශ්‍රීනාත්**
කීර්ති පැස්කුවල් ගේ අම්මා ගීතය නිර්මාණය කළෙත් ඔබ.. එවැනි ජනප්‍රිය වූ ගීත තව තියෙනවද?
**කැමරන්**
ඔව්.. මම ගීත විශාල සංඛ්‍යාවක සංගීතය නිර්මාණය කරලා තියෙනවා.. ඔස්ට්‍රේලියවේ ගායක ගායිකාවන්ට පමණක් නෙවෙයි ලංකාවේ ගායක ගායිකාවන්ට පවා මම තනු නිර්මාණය කරලා දීලා තියෙනවා..

**ශ්‍රීනාත්**
අලුත් අංගයක් වී තිබෙන කලින් පටිගත කළ සංගීතයට වේදිකාවල් වල ගීත ගායනා කිරීම ගැන ඔබේ අදහස මොකක්ද?
**කැමරන්**
මෙය මතබධෙයට තුඩු දෙන දෙයක්.. මේකේ හොඳ නරක දෙපැත්තම තියෙනවා.. හොඳ පැත්ත තමයි කලින් පටිගත කිරීමක් කරන විට වාද්‍ය ශිල්පීන් විශාල සංඛ්‍යාවක් යොදවා බොහොම පිරිච්ච සංගීතයක් නිර්මාණය කරගන්න පුලුවන්. එයට අනුකූලව ගීත ගායනා කරන විට සංගීතය පැත්තෙන් අමුත්තක් තියෙනවා. නමුත් වේදිකාව වැනි සජීවී පරිසරයක ගීත ගායනා කරන විට එහි සජීවී බවක් තිබිය යුතුයි. කලින් පටිගත කළ ගීත වාදනය වන විට එහි සජීවී බව නැති වෙනවා. ගායකයාට හෙම්බිරිස්සාවක් වත් හැදිලා තිබුණොත් ස්කේල් එක එහාට මෙහාට කරගන්නවත් බැරි වෙනවා. එහෙම වෙලාවට ගායකයා අමාරුවේ වැටෙනවා. ඒ වගේම ගීතය වේදිකිවෙද් හැඩ වැඩ කර ගායනා කරන්නත් බැරි වෙනවා.

**ශ්‍රීනාත්**
නව පරපුරේ ගායක ගායිකාවන් ගැන ඔබේ අදහස මොකක්ද?
**කැමරන්**
අලුතෙන් ආපු හුඟක් හොඳ ගායක ගායිකාවන් ඉන්නවා. ඒ අය සංගීතය හොඳ හැටි ඉගෙනගෙන තිබෙන බව ඔවුන්ගේ ගීත අහන-කොට මට දැනෙනවා. සීඩී තැටියක් කරපු පමණින් ගායකයෙක් වෙන්න බැහැ. සංගීතය සහ ගායනය ගැන යම් අවබෝධයක් දැනීමක් ලබා ගන්න එක ඉතාම වැදගත් වෙනවා. ඒව ගේම පුරුදු පුහුණු වෙන එකත් නොකඩවා කළ යුතු වැදගත් දෙයක්.

**ශ්‍රීනාත්**
ඔබ විටෙක අපි දකිනවා ගිටාරය වාදනය කරනවා. තවත් විටෙක ඕගනය වාදනය කරනවා. ඔබේ නිත්‍ය සංගීත භාණ්ඩය මොකක්ද?
**කැමරන්**
මම වඩාත් කැමති බේස් ගිටාරයටයි. මම අතීතයේ හිටපු සංගීත කණ්ඩායම් වලත් බොහෝ විට කටයුතු කළේ බේස් ගිටාර් වාදකයෙක් විදිහටයි.

**ශ්‍රීනාත්**
වෙනත් වැඩ කටයුතු රැසක් කරන අතරේදීම මේ වගේ සංගීත කණ්ඩායමක් මෙපමණ දුර ගමනක් රැගෙන යාමට හැකි වුණේ කොහොමද?
**කැමරන්**
ඒකට මූලික හේතුව මා සමග ඉන්න ශල්පීන් කිව්වොත් නිවැරදියි. ඒ අයටත් මොන තරම් වැඩ කටයුතු තිබුණත් පුහුණුවීම් සහ අනෙකුත් වැඩ වලට ඔවුන් දක්වන කැපවීම සහ උනන්දුව මත තමයි මේ ගමන මෙපමණ දුරක් යන්න අපට පුලුවන් වුණේ. මම මුලින් කිව්වා වගේ අපි වැඩක් කරනවා නම් එය හරියට කරන්න උත්සාහ ගන්න ඕනෙ. අමාරුයි. නමුත් උත්සාහය තමයි වැදගත්.

**ශ්‍රීනාත්**
පවුලේ විස්තර ටිකක් කිව්වොත්
**කැමරන්**
මගේ බිරිඳ ශ්‍රීමතී. පුතා යොහාන්. දුවල දෙන්නා නිකොල් හා නැත්ලි. මේ අයගෙන් මට ලැබෙන සහයෝගය අර මා මුලින්ම කිව්වා වගේ මගේ ගමන යන්න ලොකු ශක්තියක් වෙලා තියෙනවා.

**ශ්‍රීනාත්**
අනාගත බලාපොරොත්තුව මොකක්ද?
**කැමරන්**
මගේ ලොකු බලාපොරොත්තුවක් තියෙනවා මෙහි ජීවත්වන කුඩා ළමුන්ගේ සිට තරුණයන් දක්වා සංගීතයට ලැදි පිරිසක් තෝරා ඔවුන්ගේම ප්‍රසංගයක් පවත්වන්න. එහෙම නැත්නම් ටැලන්ට් ෂෝ එකක් පවත්වන්න. මේ දිනවල එහි මූලික කටුයුතු ආරම්භ කරලා තියෙන්නෙ. තව ටික කාලෙකින් ඒ සන්දර්ශණය අපි ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. මෙය මගේ හුඟක් කාලයක් තිස්සෙ හිතේ තිබුණ ආශාවක්.

**ශ්‍රීනාත්**
ඔබ මේ කරන්න යන ව්‍යාපෘතියට අපි සුබ පතනවා.
**කැමරන්**
ස්තුතියි ශ්‍රීනාත්. තුසිත කුලසේකර රෝහිත උඩවෙල නාලක වීරකෝන් යන හිතවතුන්ටත් මගේ ස්තුතිය හිමි වෙනවා. ඒ වගේම මේ ගමනෙදි මා සමග සිටි මගේ සියලුම හිතවතුන් ද මේ මොහොතේ දී මතක් කරන්න කැමතියි.